**ජනතා වතු සංවර්ධන මණ්ඩලය - 2014**

----------------------------------------------

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

--------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000– 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

## 2.1 මතය ව්‍යාචනය

----------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

### 2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

------------------------------

මණ්ඩලයට අයත් වතු 18 ක් අඛණ්ඩව අලාභ ලැබීම මත හා ගෙවිය යුතු ව්‍යවස්ථාපිත වගකීම් ප්‍රමාණය අධික වීම හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ශුද්ධ වත්කම් රු. 448,930,523

ක සෘණ අගයක් දක්වා අඩු වී තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව මෙම අඩුවීම සියයට 50 ක් විය. මෙවැනි තත්ත්වයක් මත භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහායක් නොමැතිව මණ්ඩලය තවදුරටත් පවත්වාගෙන යෑම අවිනිශ්චිත තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

**2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01**

---------------------------------------

2012 ජනවාරි 01 දිනෙන් පසුව නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව සංශෝධිත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07**

-------------------------------

ප්‍රමිතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 17**

-------------------------------------

කල්බදු ණය පදනම යටතේ ලබාගෙන තිබූ රු.20,500,000 ක් වටිනා ලොරි රථ 04 ක් සම්බන්ධයෙන් කල්බදු ණය පොළිය ගණනය කර ගිණුම්ගත කිරීම හා කල්බදු ණයහිමියන් මූල්‍ය ප්‍රකාශන තුල ඉදිරිපත් කිරීම ප්‍රමිතිය ප්‍රකාරව සිදු කර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40**

-------------------------------------

ආයෝජන වත්කම් ලෙස හඳුනාගත යුතු වත්කම් හඳුනානොගෙන ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ ගිණුම් ප්‍රතිපත්තිය අනුව අවසන් නිමි තේ තොග වටිනාකම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට ගිණුම් තැබිය යුතු වුවද අවසන් නිමි තේ තොගය දළ විකුණුම් අගය මත පදනම් කර ගැනීම හේතුවෙන් අවසන් තොගය රු.942,853 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හෝප් වතුයායට අදාලව අවසන් තොගය ආරම්භක තොගය ලෙසත් ආරම්භක තොගය අවසන් තොගය ලෙසත් සැලකීම හේතුවෙන් විකුණුම් පිරිවැය රු. 725,594 කින් හා අවසන් තොගය රු.362,797 කින් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී යන්ත්‍ර අලුත්වැඩියා සඳහා දරන ලද රු.1,756,528 ක වියදම ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඇ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් යන්ත්‍ර, මෝටර් වාහන සහ ජල සැපයුම් ව්‍යාපෘතිය සඳහා ක්ෂය රු.633,074 ක් අඩුවෙන්ද ගොඩනැගිලි ක්ෂය රු.291,730 ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි.

(ඉ) 2009 වසරේදී වතුයායන් තුල ක්‍රියාත්මක කරන ලද විවිධ වගා ව්‍යාපෘතීන් වෙනුවෙන් දරන ලද වියදම් රු.615,630 ක්, සේවකයින් වෙනුවෙන් ගෙවන ලද සේවක අර්ථසාධක අරමුදල් මත වූ අධිභාර රු.5,942,981 ක් හා 2012 වර්ෂයේ කම්කරු නිවාස අලුත්වැඩියා වෙනුවෙන් දරන ලද රු.4,136,732 ක් ඒ ඒ වර්ෂ වල වියදම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීම වෙනුවට ලැබිය යුතු මුදලක් ලෙස දක්වා තිබුණි.

(ඊ) 2014 වර්ෂයේදී මණ්ඩලයට අයත්ව තිබූ ඊදැල්ල වත්තෙන් අක්කර 15 ක් රු.මිලියන 30 කට විකුණා තිබූ නමුත් එය ආදායමක් ලෙස මණ්ඩලය විසින් හඳුනාගෙන නොතිබුණි. එසේම එම රු.මිලියන 30 න් රු.මිලියන 15 ක් මුදලින් ලැබී තිබූ අතර එය ප්‍රාග්ධන සංචිත ගිණුමට බැර කර තිබුණි. ඉතිරි රු.මිලියන 15 වටිනාකම ආයෝජන මණ්ඩලයට ගෙවිය යුතු මුදලට හිලව් කිරීමට එකඟ වී තිබුණද එය ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ගෙවිය යුතු ගිණුම්ද එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) පුද්ගලික සමාගමක් වෙත ලබා දී තිබූ ගොඩනැගිල්ලක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු රු.898,896 ක කුලී ප්‍රමාණය ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඌ) පෞද්ගලික සමාගමක් විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,106,812 ක අලෙවි ආදායම විකුණුම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට විකුණුම් පිරිවැයෙන් අඩු කිරීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(එ) කල්බදු ක්‍රමයට ලබාගත් ලොරි රථ 04 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී ගෙවන ලද රු.829,592 ක් ණයහිමි ගිණුමට ගැලපීම වෙනුවට අත්තිකාරම් ගිණුමෙන් අඩුකර දක්වා තිබුණි.

(ඒ) හන්තාන බංගලාව පෞද්ගලික ආයතනයක් වෙත බදු පදනමට ලබාදී 2010 වසර වෙනුවෙන් රු.249,093 ක් ද 2014 වසර වෙනුවෙන් රු.447,000 ක්ද වූ ලැබිය යුතු කුලී වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

**2.2.4** පැහැදිලි නොකළ වෙනස්කම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ණයගැති/ ණයහිමි ශේෂ අදාල රජයේ ආයතනවල මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම් ශේෂ සමඟ සැසඳීමේදී ආයතන 09 කට අදාලව රු. 710,685 සිට රු.62,354,091 ක පරාසයක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව සෘණ ශුද්ධ වත්කම් රු.448,930,523 ක් වුවත් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය අනුව එය රු.467,031,291 ක් වූයෙන් රු.18,100,768 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මණ්ඩලය විසින් තේ අලෙවිකරනු ලබන තැරුව්කරුවන්ගෙන් ලබාගත් අත්තිකාරම් ශේෂය තැරැව්කරුවන්ගේ ශේෂ සනාථ සමඟ සැසඳීමේදී රු.4,689,158 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) මූලා‍ය ප්‍රකාශනවලට අනුව තේ වලින් ලද ශුද්ධ ආදායම රු.588,323,652 ක් වුවද වතු ශේෂ එකතු ලේඛන අනුව ශුද්ධ ආදායම රු.587,845,960 ක් වූයෙන් තේ වලින් ලද ශුද්ධ ආදායමේ රු.477,692 ක වෙනසක් විය.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

--------------------------------------

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම නිසා ඒවා විගණනයේ දී සත්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

| | විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ගොඩනැගිලි | 1,535,999,899 | (i) උපලේඛන<br>(ii) ස්ථාවර වත්කම් ලේඛනය |
| (ආ) | වතු විවිධ තොගය | 2,931,210 | තොග ගණනය කිරීම් වාර්තා |
| (ඇ) | පාරිතෝෂික වෙන්කිරීම් | 327,170,766 | සේවක විස්තර හා ගණනය කිරීම් ඇතුළත් උපලේඛන |
| (ඈ) | ගෙවිය යුතු පාරිතෝෂික | 310,981,245 | සේවක නාමලේඛනය හා ගෙවිය යුතු ප්‍රමාණයන් |
| (ඉ) | තැරැව්කරුවන්ගේ අත්තිකාරම් | 8,276,108 | ශේෂ තහවුරු ලිපි |
| (ඊ) | සේවක හා විවිධ ණයහිමියෝ | 371,000,012 | උපලේඛන |
| (උ) | උපචිත වියදම් | 16,959,806 | උපලේඛන |
| (ඌ) | ආපසු ගෙවිය යුතු තැන්පත් | 48,786,050 | උපලේඛන |
| (එ) | ප්‍රධාන කාර්යාලයේ තැන්පතු | 1,108,935 | තැන්පතු සහතික |
| (ඒ) | ලැබිය යුතු බදු කුලිය | 4,378,844 | ශේෂ සනාථ කිරීම් උපෙලේන |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 16 කින් අයවිය යුතු රු.37,968,476 ක බදු කුලී සහ 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් ආරක්ෂණ ගාස්තු ලෙස ආයතන 03 කින් අයවිය යුතු රු.4,006,871 ක් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් සේවකයන්ගේ වැටුපෙන් අඩුකර තිබූ රු.9,693,850 ක් අදාල ආයතන හෝ සංගම් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් 1996 වර්ෂයේ සිට ලැබිය යුතු වේතන ගිණුමෙහි පැවත එන රු. 1,351,218 ක ශේෂය අයකර ගැනීමට හෝ ගිණුම් මඟින් ලියා හැරීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඈ) 2007 වසරේ සිට පැවත එන පෞද්ගලික ආයතනයකින් අයවිය යුතු රු.654,756 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත ඇති රු.538,712 ක තැන්පතුව 2013 ජුනි මාසයේ සිට විගණිත දිනය වූ 2016 ජනවාරි 05 දක්වාම නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත. | එක් එක් මාසය සඳහා වූ දායක මුදල් ඊළඟ මාසය අවසන් වීමට පෙර සේවක අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කළ යුතු වූවත්, ප්‍රධාන කාර්යාලයේ හා වතු අංශයේ සේවක අර්ථසාධක දායක මුදල් රු.397,765,164 ක් ප්‍රේෂණය කර නොතිබුණි |
| (ආ) | 1980 අංක 40 දරන සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් පනත | එක් එක් මාසය සඳහා වූ දායක මුදල් ඊළඟ මාසය අවසන් වීමට පෙර සේවක භාරකාර අරමුදලට ප්‍රේෂණය කළයුතු වූවත් සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන කාර්යාලයේ හා වතු අංශයේ සේවකයන් වෙනුවෙන් වූ දායක මුදල් රු.26,836,693 ක් ප්‍රේෂණය කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත | සේවය අවසන් කළ සේවකයන්ට මාසයක් තුලදී සේවක පාරිතෝෂිත මුදල් ගෙවා නිදහස් කිරීමට කටයුතු කළ යුතු වුවද ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 1983 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා පාරිතෝෂික දීමනා එකතුව රු.497,985,454 ක් ගෙවිය යුතුව තිබුණි. |
| (ඇ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 2014 වර්ෂය දක්වා අය කරගත් රු.37,192,957 ක් වූ එකතු කළ අගය මත බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඉ) | 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත. | සෑම කාර්තුවක්ම අවසන් වී ඊළඟ මාසයේ 20 දිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ආර්ථික සේවා ගාස්තු ගෙවීම් කළ යුතු වුවද, වර්ෂ ගණනාවක සිට ගෙවීම් නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු රු.7,752,214 ක ශේෂයක් වූ අතර එය 2016 ජනවාරි 18 දින වන විටත් ගෙවා නොතිබුණි |
| (ඊ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත. | බාහිර ආයතන වෙතින් අයකර ගත් ජාතිය ගොඩනැගීමේ බදු රු.5,662,131 ක් 2014 දෙසැම්බර් 31 දින වන විටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (උ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| | (i) v වැනි පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති | සේවය අතහැර ගිය නිලධාරියෙකු යලිත් සේවයට නොගත යුතු බව දන්වා තිබුණද සහකාර වතු අධිකාරීවරයෙකු සේවයට නොපැමිණීම මත සේවය හැර ගියා සේ සලකා කටයුතු කර තිබියදී නැවතත් වර්ෂ 09 කට පසු නව සේවකයෙක් වශයෙන් 2013 සැප්තැම්බර් මාසයේදී බඳවා ගෙන තිබුණි. |
| | (ii) VII වැනි පරිච්ඡේදයේ 8:1 වගන්තිය | කලින් සේවය අවසන් කර ඇති නිලධාරියෙකු පසු අවස්ථාවක නැවත සේවයේ යොදවනු ලබන්නේ නම් ඔහුගේ වැටුප තීරණය කල යුත්තේ පළමුවෙන්ම පත්වෙන අයකුගේ වැටුප තීරණය කරන අයුරින්ම වුවද සහකාර වතු අධිකාරීවරයාගේ වැටුප වැටුප් වර්ධක 17 ක් ඉදිරියෙන් තබා පිහිටුවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඌ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 371(2) (ඇ) | තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්යය නිම වූ වහාම පියවිය යුතු වූවත් පාරිභෝගික අංශය තුල 2003 වසරේ සිට 2014 නොවැම්බර් 24 දින දක්වා නිලධාරීන් හා බාහිර පුද්ගලයින් වෙත ලබා දුන් එකතුව රු.1,857,728 ක් හා ප්‍රධාන කාර්යාලයේ 2006 වසරේ සිට 2014 වර්ෂය දක්වා ලබා දුන් එකතුව රු.20,539,935 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. |
| (එ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4,4.1.1 (ඇ),4.2.1(අ) ඡේදය | පිරිවැය රු1,923,775 ක් වූ පරිගණක 20 ක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය විධිවිධාන වලින් බැහැරව සභාපතිවරයාගේ අනුමැතිය මත පමණක් මිලදී ගෙන තිබුණි. |
| (ඒ) | 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1.1 ඡේදය හා මුදල් රෙගුලාසි අංක 103(1)(ආ), 104, 105, 110 | නිල වාහන සඳහා හිමිකමක් නොමැති නිලධාරියෙකු විසින් මණ්ඩලයේ වාහනයක් භාවිතා කිරීමේදී 2012 අප්‍රේල් 05 දින අනතුරට පත් වී තිබූ අතර වාහනයේ අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඔ) | 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන අයවැය චක්‍රලේඛයේ 3 ඡේදය | මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීමේදී අදාල රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශ සහිතව ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබා ගත යුතු වූවද එයට පටහැනිව රු.20,500,000 ක් වැයකර ලොරි රථ 04 ක් මිලදී ගෙන තිබුණි. |
| (ක) | 2013 ජනවාරි 15 දිනැති අංක 01/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ I ඡේදය | වයස අවුරුදු 60 සම්පූර්ණ වූ නිලධාරින්ගේ සේවය අවසන් කළ යුතු වුවත් වතුයායන් 10 කට අදාලව නිලධාරීන් 40 දෙනෙකු විධිමත් අනුමැතියකින් තොරව සේවයේ නියුක්ත කර ඔවුන් වෙනුවෙන් 2008 වර්ෂයේ සිට 2015 අප්‍රේල් දක්වා රු. 32,232,419 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. |
| (ග) | 2014 නොවැම්බර් 22 දිනැති අංක PRE/2015/43 දරන මැතිවරණ කොමසාරිස්ගේ චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව මණ්ඩලය විසින් 2014 නොවැම්බර් 15 වෙනිදා සිට බලපැවැත්වෙන පරිදි නිලධාරීන් හා සේවකයන් 35 දෙනෙකු බඳවාගෙන තිබූ අතර නිලධාරීන් 37 දෙනෙකු සඳහා උසස්වීම් ලබාදී තිබුණි. එසේ වුවද ඔවුන් සේවා සඳහා වාර්තා කර තිබුණේ 2014 දෙසැම්බර් 01 වෙනිදාය. |

**2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

2013 ඔක්තෝබර් 25 දිනැති අංක 13/1449/553/008-8 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දැව අලෙවි ආදායම වෙනම බැංකු ගිණුමක තැන්පත් කර එහි මුදල් ආපසු ගැනීමේදී රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ පෞද්ගලික අනුමැතිය ලබා ගත යුතු බව සඳහන් වුවද ඊට පටහැනිව රු.29,283,759 ක මුදලක් වැයකර තිබුණි.තවද මෙම අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ව්‍යවස්ථාපිත වගකීම් සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතු වුවද දැව අලෙවි ආදායමෙන් සියයට 40 ක් වූ මුදල එනම් රු.12,315,000 ක් මණ්ඩලයේ සාමාන්‍ය වියදම් දැරීම සඳහා යොදාගෙන තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් රු.168,842,667 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.500,500,277 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.331,657,610 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයේදී රු.255,094,973 ක පාරිතෝෂික සඳහා ඌන වෙන් කිරීම් සිදුකර තිබුණද සමාලෝචිත වර්ෂයේ එලෙස වෙන් නොකිරීම සහ සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන රු.68,714,924 ක් වැඩියෙන් ලැබී තිබීම මෙම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

| මූල්‍ය තත්ත්වය | 2014 | 2013 |
|---|---|---|
| ජංගම අනුපාතය | 1:3.5 | 1:2.9 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 1:4.1 | 1:3.4 |

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ආයතනික ද්‍රවශීලතා මට්ටම පිරිහී ඇති බවට ඉහත අනුපාත දෙක මගින් නිරීක්ෂණය වූ අතර ජංගම වගකීම් තුල නිශ්චිතවම ව්‍යවස්ථාපිත බැඳීමක් පවතින රු. මිලියන 973 කට අධික වගකීමක් පැවතීම හේතුවෙන් ඉදිරියේදී මූල්‍ය අර්බුදයක් ඇති විය හැකි බව නිරීක්ෂණය විය.

**3.3 මණ්ඩලයට එරෙහිව හෝ මණ්ඩලය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් හා සේවක අර්ථසාධක අරමුදල් නිසි පරිදි නොගෙවීම හේතුවෙන් කම්කරු කොමසාරිස් කාර්යාලය මගින් මණ්ඩලය වෙත නඩු 614 ක් පවරා ඇති අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු සේවක භාරකාර හා අර්ථසාධක අරමුදල් වෙනුවෙන් එකතුව රු.247,028,977 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට බාහිර පාර්ශවයන් විසින් මණ්ඩලයට එරෙහිව නඩු 55 ක් පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය යටතේ තේ වතු 16 ක් රබර් වත්තක් හා පොල් වත්තක කටයුතු පවත්වාගෙන ගොස් තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුලදී එම වතු වලින් රු.325,686,780 ක අලාභයක් ලබා තිබුණි. එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 30 ක වැඩිවීමකි.

(ආ) සමාලෝචිත වර්ෂයේ තේ වතු 16 යේ නිමි තේ කිලෝ එකක දායකය රු.85 සිට රු.306 ක් දක්වා සෘණ පරාසයක වූ බව නිරීක්ෂණය විය.

(ඇ) තේ පර්යේෂණ ආයතනයේ ප්‍රමිතීන්ට අනුව මැදරට තේ හෙක්ටයාරයකට සාමාන්‍ය (නිමි තේ) එලදාව කි.ග්‍රෑම් 1200 ක් පමණ වුවද මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන වතු 16 ට අදාලව සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ 10 ක නිමි තේ එලදාව පරීක්ෂා කිරීමේදී එකම වත්තකින් හෝ සාමාන්‍ය එලදාව ලබා ගැනීමට නොහැකි වී තිබුණු අතර ලබාගත් එලදාව හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 210 සිට කිලෝග්‍රෑම් 1024 දක්වා පරාසයක විය.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හලාවත වැවිලි සමාගමින් රු.මිලියන 40 ක මුදලක් සියයට 8 ක වාර්ෂික පොළියකට යටත්ව වර්ෂ 03 කින් ගෙවී යන පරිදි 2010 අගෝස්තු 11 වන දින තේ වතුවල සංවර්ධන කටයුතු සඳහා ලබාගෙන තිබුණද මණ්ඩලය මෙම ණය මුදල වැටුප් හා දීමනා ගෙවීම සඳහා යොදාගෙන තිබුණි. එසේම 2015 දෙසැම්බර් 31 දක්වාම ණය මුදලට අදාලව වාරික මුදල් හෝ පොළී ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට රඳවාගත් රු.9,510,464 ක බදු ශේෂය ගෙවිය යුතු බදු වගකීම්වලින් හිලව් කර ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ එකඟතාවයක් ඇති කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම ඊට අදාල බදු සහතික විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

(ඇ) එකතුව රු.37,326,067 ක් ලෙස කෙරීගෙන යන වැඩ තුල ජීව විද්‍යාත්මක වත්කම් වශයෙන් රු. 5,488,627 ක්ද භෞතිකව නොමැති රු. 31,837,440 ක වගාවන් ඇතුලත් වී තිබුණි.භෞතිකව නොමැති වගාවන් පොත් වලින් ලියා හැරීමට විගණිත දිනය වූ 2016 ජුනි 30 දක්වාම කටයුතු කර නොතිබුණි.

### 4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

මණ්ඩලයේ ගලබොඩ වතුයායට අයත් හෙක්ටයාර 752 ක මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර 570.25 ක් හා තෙමහල් ගොඩනැගිල්ල සහිත තේ කර්මාන්තශාලාව 2003 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2016 ජුනි 30 දක්වා නිෂ්කාර්යව පැවතුණි.

## 4.4 ආර්ථික නොවූ ගණුදෙනු

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හෝප් වතුයාය මගින් නිෂ්පාදනය කරනු ලබන පානීය ජල බෝතල් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ලබා ගෙන තිබූ ප්‍රමිති සහතිකය කල් ඉකුත් වීමෙන් පසු නැවත එම සහතිකය ලබා ගැනීමෙන් තොරව SLS ලාංඡනය ප්‍රදර්ශනය කිරීම හේතුවෙන් ජල බෝතල් බෙදා හරිනු ලබන පාරිභෝගික අංශයට 2014 ජූලි 14 දින සිට පාරිභෝගික අධිකාරියේ නිලධාරීන් විසින් මුද්‍රා තබා තිබුණි. එම අංශයේ සේවය කරනු ලබන සේවකයින් 21 දෙනා වෙත මුද්‍රා තැබූ දිනයේ සිට විගණිත දිනය වන 2014 සැප්තැම්බර් 12 වන දින දක්වා කිසිදු රාජකාරි කටයුත්තක් ලබා ගැනීමෙන් තොරව වැටුප් වශයෙන් රු.760,000 ක් මාසිකව ගෙවා තිබුණි.

(ආ) ආයතනයේ පවතින මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් ලිඛිත ගිවිසුම්වලට එළඹීමෙන් තොරව තේ තැරැව්කරුවන්ගෙන් ලබාගත් අත්තිකාරම් සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.19,485,545 ක පොලී ගෙවා තිබුණි.

(ඇ) බැංකු අයිරා වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු.8,357,703 ක පොලී ගෙවා තිබුණි.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොළපතන වතුයායේ ගස් 106 ක් විකිණීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් වැඩිම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරුට ප්‍රදානය නොකර දැව සංස්ථාවට ලබා දීම හේතුවෙන් රු.980,000 ක අලාභයක් සිදු වී තිබුණි.

(ආ) මණ්ඩලය තුල අභ්‍යන්තර විගණන ඒකකයක් තිබියදී අභ්‍යන්තර විගණන සැලැස්ම පුද්ගලික විගණන ආයතනයක් මගින් පිළියෙල කර ගැනීමට රු. 94,534 ක් වැයකර තිබුණි.

(ඇ) සේවක භාරකාර අරමුදල්,සේවක අර්ථසාධක අරමුදල් හා සේවක පාරිතෝෂික නියමිත දිනට නොගෙවීම නිසා වර්ෂය තුළදී අධිභාර වියදම් වශයෙන් පිළිවෙලින් රු.3,363,726 ක් රු.74,593,046 ක් හා රු.9,495,305 ක් ගෙවිය යුතුව පැවතුණි.

## 4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දී ඇති මණ්ඩලයේ සම්පත්

------------------------------------------------------------------

2009 අප්‍රේල් මාසයේ සිට ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් ඩිපෙන්ඩර් රථයක් විෂයභාර අමාත්‍යවරයාගේ පරිහරණය සඳහා ලබා දී තිබුණි.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 147 ක් හා තථ්‍ය සේවක සංඛ්‍යාව 170 ක් හා වුයෙන් සේවකයින් 23 ක අතිරික්තයක් විය.

(ආ) නොදන්වා සේවයට වාර්තා නොකරන ලද සහකාර වතු අධිකාරීවරයෙකු වෙත ආයතන සංග්‍රහයේ v වැනි පරිච්ඡේදයේ 7 වගන්තිය අනුව කටයුතු කිරීමකින් තොරව 2014 මාර්තු 04 දින සිට විගණිත දිනය වූ 2014 සැප්තැම්බර් 30 දක්වා රු. 420,000 ක මුදලක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව උපදේශක තනතුරු 02 ක් හා කළමනාකරණ තනතුරක් සඳහා 2014 සැප්තැම්බර් මාසයේදී කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් බඳවා ගෙන එදින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා දීමනා ලෙස රු.613,000 ගෙවා තිබුණි.

**4.8 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුද්ගලික ආයතනයකින් මණ්ඩලයට අයවිය යුතු රු.34,851,028 ක හිඟ බදු මුදල භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව අත්හැරීමට මණ්ඩලය එකඟ වී තිබුණි. ඉහත වටිනාකම තුල බදුකරු විසින් පෞද්ගලිකව දැරිය යුතු රු.2,885,776 ක වරිපනම් ගාස්තුව හා බදුකරු විසින් ජල බිල්පත් වෙනුවෙන් තැන්පත්කර නැවත ඔහු විසින් ආපසු ලබා ගන්නා ලද රු.3,856,372 ක් ද ඇතුලත් වී තිබුණි.

(ආ) රජයේ තක්සේරු වාර්තාවක් ලබා ගැනීමකින් තොරව මහනුවර කොළපතන වතුයායේ පිහිටි ඉඩමෙන් පර්චස් 20 ක ප්‍රමාණයක් පෞද්ගලික සමාගමක් වෙත බදු දී තිබුණු අතර බදුකරු විසින් මණ්ඩලයේ අවසරයකින් තොරව ආයතන 02 ක් සඳහා අතුරු බදු දීමක් සිදුකර තිබුණි.

(ඇ) විවෘත ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව හා රජයේ තක්සේරු වාර්තා ලබාගැනීමකින් තොරව මහනුවර ග්‍රේට්වැලි වතුයායේ පර්චස් 15 ක බිම් කොටස රු.120,000 කට හා කෑගල්ල කෝපිවත්තේ හෙක්ටයාර් 42.58 ක ඉඩමක් රු.34,014 කට වාර්ෂික බදු පදනම මත බාහිර පුද්ගලයන් හා ආයතන වෙත බදු දී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

------------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

-----------------------------------

2003 ජූනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත වාර්ෂික ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වූවද,මණ්ඩලය විසින් 2014 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කර තිබුණේ 2015 දෙසැම්බර් 16 දින දීය. 2005 වර්ෂයේ සිටම අඛණ්ඩව ගිණුම් ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි.

**5.2 සංයුක්ත සැලැස්ම**

--------------------

2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් සංයුක්ත සැලැස්ම පිළියෙල කර තිබුණද ආයතනයේ පවතින අයහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කටයුතු අත්හිටුවීමට 2011 ඔක්තෝබර් 07 දින රැස් වූ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව 2012 වර්ෂයේ සිට සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

**5.3 ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

2014 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරවන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණ පාලනය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ස්ථාවර වත්කම් පාලනය
(ඈ) විකුණුම්
(ඉ) කාර්ය මණ්ඩල පරිපාලනය